සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA2 විභාගය - 2016 ජනවාරි

## (AA25) ව්‍යාපාර නීතිය හා ආචාරධර්ම

(Business Law and Ethics)

2016-01-30
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*

*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්යය ප්‍රශ්න දහය (10) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.7 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සංරචකයක් (component) **නොවන්නේ** පහත සඳහන් ඒවා අතුරෙන් කුමක් ද?

(1) ජාත්‍යන්තර සන්ධාන (treaties) සහ ගිවිසුම්.

(2) ජනාධිපති බලතල හා කාර්යයන්.

(3) ව්‍යාපාර ආරවුල් නිරවුල් කිරීම.

(4) මහජන ආරක්ෂාව. (ලකුණු 02)

**1.2** ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ බලයට අයත් **නොවන** ක්ෂෙත්‍රයක් වන්නේ පහත සඳහන් ඒවා අතුරෙන් කුමක් ද?

(1) උපදේශනමය අධිකරණ බලය (Consultative Jurisdiction).

(2) පාර්ලිමේන්තු මැතිවරණ.

(3) මූලික අයිතිවාසිකම් පිළිබඳ අධිකරණ බලය (Jurisdiction on Fundamental Rights).

(4) ව්‍යවස්ථාමය අධිකරණ බලය (Constitutional Jurisdiction). (ලකුණු 02)

**1.3** පහත සඳහන් වන අය අතුරෙන්, නියෝජිතයෙකු සඳහා උදාහරණයක් **නොවන්නේ** කවරෙක් ද?

(1) නීතිඥයෙකු (සිවිල් නඩුවකදී).

(2) සමාගම් රැස්වීමකට සහභාගී වීම සඳහා ප්‍රතිපුරුෂ පත්‍රයක් දරන්නෙකු (Proxy holder).

(3) විශේෂ ඇටෝර්නි (attorney) බලයක් දරන්නෙකු.

(4) සේවකයෙකු. (ලකුණු 02)

**1.4** ගනුදෙනු කළහැකි සාධන පත්‍රයක් සඳහා උදාහරණයක් **නොවන්නේ** පහත සඳහන් ඒවා අතුරෙන් කුමක් ද?

(1) චෙක්පතක්. (2) ස්ථාවර තැන්පතු සහතිකයක්.

(3) බැංකු අණකරයක් (bank draft). (4) විනිමය බිල්පත්‍රයක්. (ලකුණු 02)

**1.5** පොදු යහපත වෙනුවෙන් ක්‍රියාකිරීම පිණිස වෘත්තීය ආචාරධර්ම වල මූලික මූලධර්මයන් හි ප්‍රමුඛත්වයේ ලා සලකනු ලබන්නේ පහත සඳහන් ඒවා අතුරෙන් කුමක් ද?

(1) අවංකභාවය (Honesty). (2) ඍජුභාවය (Integrity).

(3) සාධාරණභාවය (Fairness). (4) කාරුණිකභාවය (Kindness).

(ලකුණු 02)

**1.6** ගිවිසුම්වලට එළඹීමේ හැකියාව (contractual capacity) සම්බන්ධයෙන් සත්‍ය වන්නේ පහත සඳහන් ප්‍රකාශන අතුරෙන් කුමක් ද?

(1) ප්‍රතිලාභ සලසන්නා වූ සේවා ගිවිසුම් වලින් බාලවයස්කරුවන් බැඳේ (binding on minors).

(2) මානසික ආබාධිත තත්ත්වයකින් පෙළෙන පාර්ශවයක් හා එළඹ ඇති ගිවිසුම් ශූන්‍ය හා හිස් (null and void) යැයි කියනු ලැබේ.

(3) මත්වීමෙන් (Intoxication) ගිවිසුමකට එළඹීමට ඇති හැකියාව අහිමි (incapacitated) කළ හැකිය.

(4) ඉහත සඳහන් ප්‍රකාශන සියල්ලම වේ. (ලකුණු 02)

**1.7** විනිමය බිල් ආඥා පනතේ නිර්වචනය කර ඇති පරිදි බිල්පතේ දරන්නෙකු හට යථාකාලයේ දරන්නෙකු (holder-in-due course) වීම සඳහා සපුරා ලිය යුතු අවශ්‍යතාවයක් **නොවන්නේ** පහත සඳහන් ඒවා අතුරෙන් කුමක් ද?

(1) බිල්පත්‍රය නීතිප්‍රකාර අයිතිකරුවෙකුගෙන් ලබාගෙන තිබිය යුතුය.

(2) මතුපිටින් පෙනෙන ලෙස සම්පූර්ණ හා විධිමත් බිල්පතක් වශයෙන් ලබාගෙන තිබිය යුතුය.

(3) දරන්නා විසින් බිල්පත අගනා ප්‍රතිජ්ඨාවකට ලබාගෙන තිබිය යුතුය.

(4) දරන්නා විසින් කල් ඉකුත්වීමට පෙර බිල්පත ලබාගෙන තිබිය යුතුය. (ලකුණු 02)

*අංක 1.8 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.8** ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය යටතට ගැනෙන නීති දෙකක්(02) සඳහන් කරන්න. (ලකුණු 02)

**1.9** ශ්‍රී ලංකාවේ නීති මූලාශ්‍ර (sources of law) දෙකක්(02) සඳහන් කරන්න. (ලකුණු 02)

**1.10** ආචාරධර්ම (ethics) සඳහා ප්‍රධාන ප්‍රවේශ දෙකක්(02) සඳහන් කරන්න. (ලකුණු 02)

*A කොටසෙහි අවසානය*

# **B කොටස**

අනිවාර්යය ප්‍රශ්න පහ (05) කි.

(මුළු ලකුණු 25)

## **02 වන ප්‍රශ්නය**

**සිල්වා** හට නිවාස දෙකක් අයිතිව තිබේ. එක් නිවසක් නිදන කාමර දෙකකින් යුක්ත වන අතර, අනෙක් නිවස නිදන කාමර තුනකින් යුක්තය. **සිල්වාට** අයිති ගෙවල් දෙකම පිළිබඳව දන්නා **ඩයස්** ට නිදන කාමර දෙකේ නිවස විකිණීමට **සිල්වා** විසින් අර්පණය (offer) කරයි. තමා වෙත අර්පණය කරනු ලබන්නේ නිදන කාමර තුනේ නිවස යැයි වටහාගන්නා **ඩයස්**, එය ප්‍රතිග්‍රහණය කරයි.

**සිල්වා** සහ **ඩයස්** අතර වලංගු ගිවිසුමක් (valid contract) පවතිදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

## **03 වන ප්‍රශ්නය**

විනිමය බිල්පත් ආඥා පනත මගින්, චෙක්පතක් "ඉල්ලූ විට ගෙවන ලෙස, බැංකුකරුවෙකු වෙත ලියනු ලබන (drawn on a banker) විනිමය බිල්පතක්" ලෙස නිර්වචනය කරනු ලබයි. කෙසේවුවත්, චෙක්පතක් සහ විනිමය බිල්පතක් අතර මූලික වෙනස්කම් (fundamental differences) තිබේ.

චෙක්පතක් සහ විනිමය බිල්පතක් අතර ඇති වෙනස්කම් පහක්(05) **සඳහන් කරන්න**. (ලකුණු 05)

## **04 වන ප්‍රශ්නය**

"නියෝජ්‍යත්වය යනුවෙන් අදහස් කරනු ලබන්නේ ප්‍රධානියා සහ නියෝජිතයා අතර සම්බන්ධතාවයයි. ප්‍රධානියා සහ නියෝජිතයා අතර සම්බන්ධතාවය නොයෙක් ආකාර වලින් ඇතිවේ."

ප්‍රධානියා හා නියෝජිතයා අතර සම්බන්ධතාවය ඇතිකෙරෙන ක්‍රම පහක්(05) **සඳහන් කරන්න**. (ලකුණු 05)

## **05 වන ප්‍රශ්නය**

ජාත්‍යන්තර වෙළෙඳාමේ භාවිත වන ඉතාමත් ජනප්‍රිය ගිවිසුම් වර්ගයක් වනුයේ CIF ගිවිසුම් ය. මෙම ගිවිසුම් වර්ගයේ දී ගැනුම්කරු වෙත භාණ්ඩ බාරදෙමින් නොව, නැව්ගත කිරීමේ ලියකියවිලි බාර දීමෙන් විකුණුම්කරු විසින් ගිවිසුම ඉටුකරනු ලබයි.

(a) එකී නැව්ගත කිරීමේ ලියකියවිලි තුනක්(03) **සඳහන් කරන්න**.

(b) ඉහත කී නැව්ගත කිරීමේ ලියකියවිලි අතුරෙන් ඔබ විසින් තෝරාගත් එකක වැදගත්කම **පැහැදිලි කරන්න**.

(ලකුණු 05)

## **06 වන ප්‍රශ්නය**

**මැටිල්ඩා ද සිල්වා** පසුගිය වර්ෂ පහ (05) තිස්සේ වෘත්තීය මට්ටමින් කොණ්ඩා සැකසීමේ කාර්යයේ නිරතව සිටී. ඇයගේ ව්‍යාපාරය දැනට කොළඹ ප්‍රදේශයේ ජනප්‍රිය වී පවතින අතර, රටේ වෙනත් ප්‍රදේශවලද ශාඛා කිහිපයක් පවත්වා ගැනීම පිළිබඳව ඇය සිතා බලමින් සිටී.

**මැටිල්ඩා ද සිල්වා** ට ඇයගේ නම **"මැටිල්ඩා ද සිල්වා"** යන වෙළෙඳ ලකුණ (trade mark) යටතේ, ලියාපදිංචි කළ හැකිදැයි 2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනත යටතේ **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

*B කොටසෙහි අවසානය*

# <u>C කොටස</u>

අනිවාර්යය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## 07 වන ප්‍රශ්නය

26 හැවිරිදි අවිවාහක කාන්තාවක් වූ **සෙව්වන්දි** ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ මූල්‍ය සමාගමක, ගණකාධිකාරිවරියක ලෙස සේවය කරයි. ඇය 2014 වර්ෂයේ දී එම සමාගමට සම්බන්ධ විය.

(a) සාප්පු හා කාර්යාල සේවක පනතට අනුව, **සෙව්වන්දිගේ** වේතනයෙන් (remuneration) කළ හැකි අනුමත අඩුකර ගැනීම් (authorized deductions) හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(b) පහත සඳහන් එක් එක් අවස්ථාව යටතේ **සෙව්වන්දි ට** අදාල වන නිවාඩු හිමිකම් (leave entitlements) **පැහැදිලි කරන්න**:

(i) **සෙව්වන්දි** අසනීප වී දින දෙකක් ගෙදර නවතියි.

(ii) **සෙව්වන්දි** විවාහ වන අතර, විවාහ මංගල්‍යය සඳහා දින දහයක නිවාඩුවක් අවශ්‍ය වෙයි.

(iii) **සෙව්වන්දි** ගැබිනියක වන අතර, ඇයගේ ප්‍රථම දරුවා ප්‍රසූත කිරීමට සූදානම්ව සිටියි. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## 08 වන ප්‍රශ්නය

(a) තෙවන වර්ෂය අවසානයේ දී නැවත මිලදී ගැනීමේ විකල්පය ඇතිව මූල්‍ය පහසුකම් සලසන (financier) **ABC මූල්‍ය සමාගමෙන්, අනිල්** මෝටර් වාහනයක් අවුරුදු තුනකට (03) කුලියට ගනී. මෝටර් වාහනයේ අයිතිකරු තමා යැයි ද මෙය භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් යැයි ද **අනිල්** විශ්වාස කරයි.

මෙම ගනුදෙනුව, භාණ්ඩ විකිණීමේ ආඥා පනත මගින් ආවරණය වන්නේදැයි (governed) **පැහැදිලි කරන්න**.

(ලකුණු 04)

(b) ප්‍රමුඛ පෙළේ රක්ෂණ සමාගමක් වන **AR රක්ෂණ සමාගමේ, ජීවිත** රක්ෂණ ඔප්පුවක් සඳහා **මිහිරාන්** අයදුම් කරන ලදී. වෙනත් රක්ෂණ සමාගම් සමග ජීවිත රක්ෂණ ඔප්පු කිසිවක් තිබේදැයි **AR රක්ෂණ සමාගම** ඔහුගෙන් විමසන ලදී. වෙනත් රක්ෂණ සමාගම් වලින් ජීවිත රක්ෂණ ඔප්පු ලබාගැනීම සඳහා අයදුම් කළද ඔහු විසින් ඉදිරිපත් කළ අයදුම්පත් එම රක්ෂණ සමාගම් මගින් ප්‍රතික්ෂේප කරන ලද බව ඔහු අනාවරණය කළේ නැත. තවද, ඔහුගේ අයහපත් සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව ද **AR රක්ෂණ සමාගමට** ඔහු අනාවරණය කළේ නැත. **මිහිරාන්** සැපයූ තොරතුරු මත විශ්වාසය තබා **AR රක්ෂණ සමාගම, මිහිරාන්** වෙත ජීවිත රක්ෂණ ඔප්පුවක් නිකුත් කරන ලද අතර වර්ෂයකට පසු ඔහු අභාවප්‍රාප්ත විය. **මිහිරාන්ගේ** බිරිඳ දැන් වන්දි ලබාගැනීම සඳහා ඉදිරිපත් වී සිටී.

**AR රක්ෂණ සමාගමෙන්** වන්දි ඉල්ලුම් කිරීමට **මිහිරාන්ගේ** බිරිඳට හිමිකම් තිබේදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## 09 වන ප්‍රශ්නය

**ඇන්,** ඇගේ දියණිය වන **රෝෂිණී** සහ ඇයගේ බෑනා වන **ගිහාන්,** සාර්ථක ඇඟළුම් ව්‍යාපාරයක් වන **ARG ෆැෂන්ස්** නම් වූ ව්‍යාපාරයේ හවුල්කරුවෝ වෙති. ඔවුන් මෙම ව්‍යාපාරය වර්ෂ දහයක් තිස්සේ කරගෙන යනු ලබයි. **ඇන්ට** දැන් වයස අවුරුදු 65 ක් වන අතර රෝෂිණී ඇයගේ කුළුඳුල් දරුවා අපේක්ෂාවෙන් සිටී. ඔවුන්ගේ ව්‍යාපාරය පුළුල් කිරීමට ඔවුන්ට අවශ්‍ය වුවත් ඔවුන්ගෙන් කිසිවෙකුට කිසිඳු අවදානමක් හෝ වැඩි වගකීම් දැරීමට අවශ්‍යතාවයක් නැත. ඔවුන් විසින් ඔවුන්ගේ හවුල් ව්‍යාපාරය, සමාගමක් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව සළකාබලමින් සිටින අතර, හවුල් ව්‍යාපාරයක් වගකීම් සීමිත පෞද්ගලික සමාගමක් බවට පරිවර්තනය කිරීමේ වාසි සහ අවාසි පිළිබඳව ඔබගෙන් උපදෙස් ඉල්ලා සිටී.

වගකීම් සීමිත පෞද්ගලික සමාගමක් හා සැසඳීමේදී හවුල් ව්‍යාපාරයක පවතින වාසි සහ අවාසි **පැහැදිලි කරන්න**.
(ලකුණු 10)

*C කොටසෙහි අවසානය*

## <u>D කොටස</u>

අනිවාර්යය ප්‍රශ්නයකි.

(ලකුණු 25)

## 10 වන ප්‍රශ්නය

(a) **අමල්** උසස් පෙළ විභාගය සමත්වීමෙන් පසු, ගණකාධිකාරිවරයෙකු වීම සඳහා, වෘත්තිය ගණකාධිකරණ ආයතනයක ලියාපදිංචි වී පාඨමාලාවකට අදාලව පුද්ගලික පන්ති වලට සහභාගි විය. නිශ්චිත ශ්‍රිතයන්ගෙන් (specific functions) යුක්ත වැඩසටහන් ගත නොකල විද්‍යුත් ගණක යන්ත්‍ර (non-programmable scientific calculators) සියලුම ශිෂ්‍යයන් විසින් මිලදී ගැනීම අවශ්‍ය බවට ඔහුගේ දේශකයන් විසින් උපදෙස් දෙන ලදී. එබඳු ගණක යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා සුප්‍රසිද්ධ පොත්හලක් වූ **"පොත් සාප්පුව"** වෙත අමල් ගියේය. තම අවශ්‍යතාවය **"පොත් සාප්පුව"** හී විකුණුම් නිලධාරියාට **අමල්** පැහැදිලි කළ අතර ගණක යන්ත්‍රය මිලදී ගැනීමේදී එම නිලධාරියාගේ තීරණය (judgment) කෙරෙහි ඔහු විශ්වාසය තැබීය. එම ගණක යන්ත්‍රය ඔහු විසින් පන්තියට රැගෙන ගිය විට, එම ගණක යන්ත්‍රයේ අවශ්‍ය ශ්‍රිතයන් (functions) නොමැති බවත්, එය අධ්‍යාපන කටයුතු වලට ප්‍රමාණවත් නොවන බවත් ඔහුගේ දේශකවරයා සඳහන් කරන ලදී. **අමල්ට** ගණක යන්ත්‍රය **"පොත් සාප්පුව"** වෙත නැවත බාරදී ඔහු ගෙවූ මුදල නැවත ලබා ගැනීමට අවශ්‍ය විය.

ගෙවූ මුදල නැවත ලබා ගැනීමට **අමල්ට** හිමිකම තිබේදැයි **විමසන්න**. (ලකුණු 13)

(b) **A** විසින් අලුතෙන් මුදාහළ ක්‍රියාදාම චිත්‍රපටියක් නැරඹීම සඳහා "රිදීතිර සිනමා" නම් වූ චිත්‍රපට ශාලාවට යන ලදී. චිත්‍රපටිය ආරම්භ වීමට පෙර ප්‍රදර්ශනය කළ දැන්වීම් හා වෙළෙඳ දැන්වීම් අතරතුර, "මෙම චිත්‍රපට ශාලාව අළුත්වැඩියා කෙරෙමින් පවතින අතර, ලී බඩු හා සවිකිරීම් නැවත සකස් කෙරෙමින් පවතී. එබැවින්, ප්‍රේක්ෂකාගාරයේ කිසියම් තරඹන්නෙකුට සිදුවිය හැකි යම් හානියකට චිත්‍රපට ශාලා කළමනාකරණය වගකියනු නොලැබේ (not liable for any injury)." යන දැන්වීම ප්‍රදර්ශනය කරන ලදී. ක්‍රියාදාම චිත්‍රපටි ලෝලියෙකු වූ **A** තිරයේ දිස්වූ එම දැන්වීම නොසළකා හැරිය අතර, කැළඹුනු සිතින් යුතුව, චිත්‍රපටය ආරම්භ කරන තෙක් බලා සිටියේය. චිත්‍රපටය ආරම්භ වූ පසු ඔහු වාඩි වී සිටිමින්ම චිත්‍රපටයේ අභියෝගාත්මක ක්‍රියාකාරකම් අනුකරණය කිරීමට ප්‍රයත්න දරන ලදී. පුටුව මත ඔහු විසින් සිදුකළ ක්‍රියාකාරකම් හේතුවෙන් එය කැඩුණු අතර **A** ගේ කොන්ද ඒ නිසා බරපතල ලෙස තුවාල විය. ළඟම තිබූ පෞද්ගලික රෝහලකට ඔහුව ඇතුලත් කරනු ලැබීය.

"රිදීතිර සිනමා" කළමනාරිත්වය විසින් ඔහුගේ වෛද්‍ය ප්‍රතිකාර සඳහා වූ බිල්පත් පියවිය යුතු බව **A** කියා සිටියේය.

"රිදීතිර සිනමා" කළමනාකාරිත්වයෙන් එම වෛද්‍ය ප්‍රතිකාර සඳහා දැරූ වියදම් ඉල්ලා සිටීමට **A** ට නීත්‍යානුකූලව හිමිකමක් පවතීදැයි **විමසන්න**. (ලකුණු 12)

(මුළු ලකුණු 25)

*D කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>අවබෝධය<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැළකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>භාවිතය<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>විශ්ලේෂණය<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |